**ධීවර,ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශය**

**මධ්‍යම මත්ස්‍ය වෙළඳපල සංකීර්ණය - පැලියගොඩ**

Procurement No: CFMC/MT/Admin/2025/ C&PC S

# පැලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳපල සංකීර්ණයේ පිරිසිදු කිරීමේ සහ පලිබෝධ මර්දනය කිරීමේ සේවාව සැපයීම සඳහා ලංසු කැඳවීම - 2025

ධීවර, ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශය යටතේ කළමනාකරණ භාරයක් මඟින් පාලනය වන පැලියගොඩ පිහිටි මධ්‍යම මත්ස්‍ය වෙළඳපල සංකීර්ණයට වර්ෂ දෙකක කාල සීමාවක් වෙනුවෙන් පිරිසිදු කිරීමේ සහ පලිබෝධ මර්දනය කිරීමේ සේවාව සැපයීම සඳහා පහත සඳහන් අවශ්‍යතාවයන් සපුරාලන ලංසුකරුවන්ගෙන් පමණක් පැලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳ සංකීර්ණ කළමනාකරණ භාරයේ සභාපති විසින්, 2026.01.08 වන දින ප.ව. 02.00 දක්වා මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

2010 වර්ෂයේදී ආරම්භකර ඇති පැලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳපල සංකීර්ණය, වෙළඳකුටි 154 කින් සමන්විත තොග වෙළඳපළකින්ද, වෙළඳකුටි 128 කින් සමන්විත සිල්ලර වෙළඳපළකින්ද, වාහන 500 ක් පමණ ගාල් කළ හැකි රථගාලකින්ද සමන්විත වන අතර වර්තමානය වන විට විශාල ගණුදෙනුකාරභවතුන් සහ වෙළඳ ප්‍රජාවක් විසින් දෛනිකව භාවිතා කරනු ලබන ඉතා කාර්යබහුල ශ්‍රී ලංකාවේ දැනට පවතින ප්‍රධානතම සහ විශාලතම මසුන් අලෙවි ආයතනය ලෙස ආර්ථික වශයෙන් ශක්තිමත් භාවයට පත්ව ඇත.

1. ජාතික තරගකාරී ලංසුකරණ ක්‍රියා පටිපාටිය (NCB) තුළින් මෙම ලංසුකරණය පවත්වනු ලබයි.

ලංසුකරු :-

2. ශ්‍රී ලංකා සමාගම් පනත යටතේ ලියාපදිංචි වී තිබිය යුතුය.

3. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් පිරිනමනු ලබන වාණිජ, වෙළඳ සහ ආගන්තුක සත්කාර ඇතුළත් විවිධ අංශ සඳහා මිනිස් බල සහ සනීපාරක්ෂක සේවා සැපයීම සම්බන්ධ ISO 9001:2015/ SLS ISO 9001:2015 තත්ව සහතිකය හෝ පරිසර කළමනාකරණය සම්බන්ධ ISO 14001 තත්ව සහතිකය හෝ වෘත්තීය සෞඛ්‍ය සහ ආරක්ෂාව සම්බන්ධ ISO 45001 තත්ව සහතිකය හෝ සහිත ලංසුකරුවන් සඳහා ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.

4. රාජ්‍ය අංශයේ, සංස්ථා/ ව්‍යවස්ථාපිත ආයතන වල හෝ පිළිගත් පෞද්ගලික ආයතන වල ආසන්නතම වසර 03 ක සේවා පළපුරුද්දක් තිබිය යුතු අතර එයින් එක් ආයතනයක හෝ අවම වශයෙන් සේවකයින් 40 දෙනෙකුට වැඩි සංඛ්‍යාවක් සේවයේ යොදවා තිබිය යුතුය.

5. පිරිසිදු කිරීමේ සහ පලිබෝධ මර්දනය කිරීමේ කටයුතු සඳහා අවශ්‍ය පහත වගුවෙහි සඳහන් කර ඇති යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ එකී වගුවෙහි දක්වා ඇති පරිදි ලංසුකරු සතු විය යුතුය.

| | යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ | මෙම කොන්ත්‍රාත්තුව යටතේ දිනකට අවශ්‍ය සංඛ්‍යාව. | ලංසුකරු සතුව අනිවාර්යයෙන් තිබිය යුතු සංඛ්‍යාව. | කුලියට ගැනීමෙන්, බද්දට ගැනීමෙන් හෝ වෙනත් ආකාරයකින් සපයාගත හැකි සංඛ්‍යාව. |
|---|---|---|---|---|
| 01. | High Pressure Water Gun Machine | 06 | 03 | 03 |

| | | | | |
|---|---|---|---|---|
| 02. | Floor Cleaning Machine | 05 | 03 | 02 |
| 03. | SS Mosquito Fogging Machine | 01 | 01 | - |
| 04. | 16L Herbicide Sprayer | 01 | - | 01 |
| 05. | Petrol Lawn mower | 01 | - | 01 |
| 06. | Garbage removal cart | 06 | 04 | 02 |
| 07. | 3/4 in. Hose Pipe | 300m | 300m | - |
| 08. | 1/2 in. Hose Pipe | 60m | 60m | - |

6. ලංසු ඉදිරිපත් කළ යුත්තේ අංක 83/1, මීගහවත්ත පාර, පැලියගොඩ යන ලිපිනයෙහි පිහිටා ඇති පැලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳ සංකීර්ණයේ පරිපාලන කාර්යාලය වෙතින් 2025.12.19 වන දින සිට 2026.01.07 වන දින දක්වා පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා ලංසුකරු විසින් තම ලිපි ශීර්ෂය සහිත වූ ලිපියකින් ඉල්ලුම් කර ලබා ගත් ආකෘති පත්‍ර මඟින් පමණි. තවද එකී කාල සීමාව තුළදී ඕනෑම ලංසුකරුවෙකු වෙත අදාළ ලංසු ලේඛනයන් නොමිලේද පරීක්ෂා කර බැලිය හැක.

7. ලංසු පත් ලබා ගැනීමට පෙර ආපසු නොගෙවනු ලබන රු. 12,500/- ක ලංසු ගාස්තුවක් පැලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳපල සංකීර්ණයේ කළමනාකරණ භාරයේ ගිණුම් අංක 71446342 දරණ ලංකා බැංකු ගිණුමෙහි තැන්පත් කර අදාළ රිසිට් පත පැලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳ සංකීර්ණයේ පරිපාලන කාර්යාලයේ ගිණුම් අංශය වෙත ඉදිරිපත් කර මුදල් කුවිතාන්සියක් ලබා ගත යුතුය.

8. මීට අදාළ පූර්ව ලංසු හමුවක් 2025.12.30 වන දින පෙ.ව. 10.00 පැලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳ සංකීර්ණයේ ප්‍රධාන ශ්‍රවනාගාරයේදී පැවැත්වේ.

9. ලංසු 2026.04.08 වන දින දක්වා වලංගු විය යුතුය.

10. සියලුම ලංසු සමඟ 2026.05.06 වන දින දක්වා වලංගු සහ ලංසු ලිපිලේඛන සමඟ දක්වා ඇති ආකෘතියට අනුකූලවද, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කරන ලද වාණිජ බැංකුවකින් ලබාගත් ආපසු හැරවිය නොහැකි සහ ප්‍රසම්පාදන අස්තිත්වය විසින් සිදු කරන පළමු ලිඛිත ඉල්ලීම මත කොන්දේසි විරහිතව මුදල් කළ හැකි බැංකු ඇපකරයක් ආකාරයෙන් වන රුපියල් පන්ලක්ෂඅසූදහස (රු.580,000/-)ක වටිනාකමින් යුත් ලංසු සුරක්ෂණයක් ඉදිරිපත් කළ යුතුය. නැතහොත් එකී වටිනාකම හා සමාන මුදලක් පැලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳපල සංකීර්ණයේ කළමනාකරණ භාරයේ ගිණුම් අංක 71446342 දරණ ලංකා බැංකු ගිණුමෙහි තැන්පත් කර අදාළ රිසිට් පත පැලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳපල සංකීර්ණයේ පරිපාලන කාර්යාලයේ ගිණුම් අංශය වෙත ඉදිරිපත් කර එම අංශය වෙතින් නිකුත් කරනු ලබන මුදල් කුවිතාන්සියෙහි මුල් පිටපත ඉදිරිපත් කළ යුතුය.

11. නිසි පරිදි සම්පූර්ණ කරන ලද ලංසු අයදුම්පත්, 2026.01.08 වන දින ප.ව. 02.00 ට පෙර ලැබෙන සේ

**සභාපති**
**පැලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳපල සංකීර්ණ කළමනාකරණ භාරය,**
**ප්‍රධාන ගණකාධිකාරී කාර්යාලය, දෙවන මහළ,**
**ධීවර,ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශය,**
**නව මහලේකම් කාර්යාලය, මාලිගාවත්ත,**
**කොළඹ 10**

යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ, ධීවර,ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශයේ, දෙවන මහලේ මුදල් අංශයේ තබා ඇති ලංසු පෙට්ටියට බහාලීම හෝ කළ යුතුය.

12. ලංසු පත් විවෘත කරනු ලබන අවස්ථාවේ ලංසුකරුට හෝ ඔහු විසින් බලය පැවරූ නියෝජිතයකුට පැමිණ සිටීමට අවසර දෙනු ලැබේ. 2026.01.08 වන දින ප.ව. 02.00 ට ලංසු කැදවීම අවසන් කළ වහාම ලැබී ඇති

ලංසු පත්, ධීවර, ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශයේ දෙවන මහලෙහි පිහිටි ප්‍රධාන ගණකාධිකාරීගේ කාර්යාලයේ දී විවෘත කරනු ලැබේ.

13. මේ සම්බන්ධයෙන් වැඩිමනත් විස්තර පෑලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳපල සංකීර්ණයේ ප්‍රසම්පාදන නිලධාරීගේ දුරකථන අංක 011-3301707 ඇමතීමෙන් ලබා ගත හැක.

**සභාපති**
පෑලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳපල සංකීර්ණ කළමනාකරණ භාරය,
ධීවර,ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශය,
නව මහලේකම් කාර්යාලය, මාලිගාවත්ත,
කොළඹ 10.